**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක;46/90**

රාජ්‍ය පරිපාලන, පළාත්සභා හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1990 ඔක්තෝබර් මස 30 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන්, පළාත් රාජ්‍ය සේවා
කොමිෂන් සභා ලේකම්වරුන් සහ රාජ්‍ය සංස්ථාවල/
රජය සතු සමාගම්වල/ රජයට අයත් ව්‍යාපාරික ආයතනවල
සභාපතිවරුන්/ නිසි බලධාරීන් වෙත.

## බඳවාගැනීමේ පරිපාටිවලට ඇතුළත් කළයුතු වෙනත් අධ්‍යාපනික සුදුසුකම්

පහතින් දැක්වෙන අධ්‍යාපනික සුදුසුකම් අදාල බඳවා ගැනීමේ පරිපාටිවල දක්වා ඇති සුදුසුකම්වලට විකල්ප අධ්‍යාපනික සුදුසුකම් වශයෙන් භාර ගතයුතු යයි නිගමනය කර ඇත.

| නව අධ්‍යාපනික සුදුසුකම් | එම සුදුසුකම්වලට සමාන කළහැකි වෙනත් අධ්‍යාපනික සුදුසුකම් | වැඩි විස්තර සඳහා විමසීම් |
|---|---|---|
| I.ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් පවත්වනු ලබන පෙදරේරු, වඩු, විදුලි රැහැන් ඇදීම, ජල නල, වානේ සවිකුරු හා කම්බි නැමීම හා වාහන කාර්මික හා මෙහෙයුම් ශිල්ප යන ක්ෂේත්‍රවල ජාතික වෘත්තීය පරීක්ෂණයේ II. ශ්‍රේණියේ සාමාර්ථය. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අංති කාර්මික විද්‍යාලයක අදාල ක්ෂේත්‍රයකින් ලබාගත් ජාතික වෘත්තීය සහතිකය | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යොමු අංකය:කාඅ/5/14/7 |
| II.උසස් ජාතික ඩිප්ලෝමාව - ඉංජිනේරු (උ.ජා.ඩි.ඉ.) | ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (ජා.තා.ඩි) | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (කාර්මික අධ්‍යාපන ශාඛාව) යොමුඅංකය:ටීඊ/එස්/13/72(12) |
| III.ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ උසස් ජාතික සිව් අවුරුදු ගණකාධිකාරී ඩිප්ලෝමා (අවසාන) | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලත් වාණිජවේදී උපාධිය (සාමාන්‍ය සාමාර්ථය) | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (කාර්මික අධ්‍යාපන ශාඛාව) යොමු අංකය:කාඅ/5/14/7) |

| | | |
|---|---|---|
| I.ලංකා කාර්මික විද්‍යාලයේ උසස් ජාතික සිවු අවුරුදු ගණකාධිකරණ ඩිප්ලෝමා පිළිබඳ පාඨමාලාවේ 2 වන අවුරුදු සහතිකය (තනතුරු සඳහා සුදුසුකම් පිළිබඳව වාණිජ විද්‍යාවේ දැනුමක් අවශ්‍ය බව බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන් අවස්ථාවලදී පමණක්) | පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රථම හෝ මධ්‍යම සහතිකය | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ යොමු අංක:කාඅ 5/14/7 |
| II.ලංකා කාර්මික විද්‍යාලයේ සිව් අවුරුදු උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාව (අවසාන) | පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජවේදී උපාධිය (සාමාන්‍ය සාමාර්ථය) | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ යොමු අංක:කාඅ 5/14/7 |
| III.ලංකා කාර්මික විද්‍යාලයේ සිව් අවුරුදු උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාව පිළිබඳ පාඨමාලාවේ 2 වන අවුරුදු සහතිකය. (තනතුරු සඳහා සුදුසුකම් පිළිබඳ වාණිජ විද්‍යාවේ දැනුමක් අවශ්‍ය බව බඳවාගැනීමේ පරිපාටිවල සඳහන් අවස්ථාවලදී පමණක්) | පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රථම හෝ මධ්‍යම සහතිකය | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ යොමු අංක:කාඅ 5/14/7 |
| IV.අදාල විෂයයන් සහිත එම්ෆිල් හෝ එම්.එස්.සී. උපාධියක් සමග ඇති එක්සත් රාජධානියේ ජීව විද්‍යා ආයතනය පිරිනමන උපාධිය | ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය මගින් පිරිනමන අදාල ක්ෂේත්‍රයේ 02 වන පන්තියෙ විශේෂ උපාධිය | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යොමු අංකය:උඅ/4/6/13 '(iv) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යොමුව යුජීසී/ඒසී/3/4 |
| V.ජාතික අධ්‍යාපන ආයතන මගින් පිරිනමන වැඩි දියුණු කරන ලද අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකය | දුරස්ථ අධ්‍යාපන විධි මාර්ගයෙන් විවෘත විශ්ව විද්‍යාලය මගින් පවත්වන ලබන අධ්‍යාපන ඩිප්ලෝමාව | උසස් අධ්‍යාපනන අමාත්‍යාංශය යොමු අංකය:4/ගරු/ආ/සාප්‍ර/17 |
| VI.විභාග කොමසාරිස් විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික සහතිකය සමග අදාල ක්ෂේත්‍රයේ (ජා.තා.ස.) පස් අවුරුදු ප්‍රායෝගික පළපුරුද්ද (රාජ්‍ය සංස්ථා අංශවල හෝ පෞද්ගලික අංශයේ පිළිගත් ආයතනයක ) තාක්ෂණිකයෙක් වශයෙන් (සම්බන්ධයි) | ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (ජා.තා.ඩි.) හෝ උසස් ජාතික ඩිප්ලෝමාව, ඉංජිනේරු | අධ්‍යාපන හා උසස් අධ්‍යාපනන අමාත්‍යාංශය (කාර්මික අධ්‍යාපන ශාඛාව) යොමු අංකය:ටීඊ/එස්/13/72 (1) |

කලින්
විභාග කොමසාරිස් විසින් පිරිනමනු ලැබූ
ඉංජිනේරු සහතිකය සමග අදාල
ක්ෂේත්‍රයේ පස් අවුරුදු ප්‍රායෝගික
පළපුරුද්ද (රාජ්‍ය, සංස්ථා අංශවල
හෝ පෞද්ගලික අංශයේ පිළිගත්
ආයතනයක්) තාක්ෂණිකයෙන් වශයෙන්.

**සටහන:**

මෙම සමීකරණය, ඉගැන්වීමේ පත්වීම්වලට හැර
අනිකුත් සියළුම පත්වීම්වලටඅදාල වේ. තවද
මෙහිදී සැලකිය යුතු කරුණක් නම් බඳවා ගැනීම්වලදී
සුදුසුකමක් ලෙස ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව
සලකනු ලබන අවස්ථාවලදී පමණක් මෙය වලංගු
වන බවයි.

02 අදාළ බඳවා ගංනීමේ පරිපාටි පරීක්‍ෂා කර බලවා මෙම නව අධ්‍යාපනික සුදුසුකම් යෝග්‍ය අවස්ථාවන්හිදී එම පරිපාටිවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු මැනවි.

අ.කලේ/(ආර්. අබේරත්න)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.